# ස්වාභාවික ආපදාවන් සහ නාගරික දිළිඳු ජනතාව

උපුල් ජයතිලක

වසර ගණනාවක් තිස්සේ ඉතා ශීඝ්‍රයෙන් සිදුවන්නා වූ ග්‍රාමීය ජනතාවගේ නගර කරා සංක්‍රමණය වීමත්, නාගරීකරණයත් සමඟ නගරාසන්නයේ ජීවත්වන ප්‍රජාව ඔවුන්ගේ වාසස්ථාන පුළුල් කිරීමත් තුළ නාගරික තදබදය ඉහළයාම වැළැක්විය නොහැකි තත්ත්වයකි. වඩා හොඳ මට්ටමේ ආර්ථික හැකියාව ඇති අය විසින් තම වාසස්ථානය වඩාත් ආරක්‍ෂාකාරී ස්ථානයක සුවපහසු අන්දමින් ඉදිකරගත් අතර තම ආර්ථික නොහැකියාව හේතුවෙන් විවිධ වූ ආපදා අවදානම් සැලකිල්ලට නොගෙන ඉතා අඩු වියදමකින් අවම පහසුකම් සහිතව තම නිවස තනාගෙන නාගරික ජීවිතයක් ගතකරන ජන කොට්ඨාසයක් සෑම නගරයක් ආශ්‍රිතවම පැහැදිලිව හඳුනාගත හැක. මොවුන් අතර අනවසර පදිංචිකරුවන් සහ තාවකාලිකව ඉදිකරගත් පැල්පත් තුළ ජීවත්වන්නන්ද දැක ගත හැකිය.

අතීතයේ නොපැවතිය ද වර්තමානයේ ශ්‍රී ලංකාවේ සිදුකරනු ලබන සංවර්ධන ව්‍යාපෘති ඊට අදාළ පාරිසරික බලපෑම් ඇගයීමකට අනුකූලව කටයුතු කිරීම අනිවාර්යය. නමුත් එය නිසි පරිදි අධීක්‍ෂණය කිරීමට ඇති ක්‍රමවේදය එතරම් ශක්තිමත් නැතුවාසේම, ආපදා අවදානම් සම්බන්ධයෙන් නිසි අවධානයක් යොමුකිරීම තවමත් සිදුනොවීම එනම් ආපදා අවදානම් ඇගයීමක් භාවිතාවේ යෙදවීමට ප්‍රමාදවීම ඒ සම්බන්ධයෙන් ලද පරාජිත තත්ත්වයක් සේ හඳුන්වා දිය හැකිය.

නාගරික සංවර්ධනයේ දී ඉහත තත්ත්වය තුළ සංවර්ධන ක්‍රියාවලිය හේතුවෙන් නිරන්තරයෙන් ආපදාවන්ට ගොදුරු වන නාගරික දිළිඳු ජන කොට්ඨාසයක් බිහිවී තිබීම නාගරික ජන ජීවිතය කෙරේ ඇති දැවැන්ත අභියෝගයක්ව පවතී.

මෑත අතීතයේ අගනුවර ආශ්‍රිත අත්දකිනු ලැබූ ස්වාභාවික ආපදාව වූයේ 2010 වසරේ මැයි මාසයේදී ඇතිවූ හදිසි ගංවතුර තත්ත්වයයි. අවතැන් වූ පිරිස දසලක්‍ෂ භාගයක්ම ඉක්මවාගිය පිරිසක් නිවාස 700ක් සම්පූර්ණ වශයෙන් ද 3, 833 අර්ධ වශයෙන්ද විනාශයට පත් පත්විණි. එමගින්ම 14,000 ආසන්න පිරිසක් අවතැන් කඳවුරු කරා යොමු කරවීමටත් ඔවුන්ට අවශ්‍ය සහන සේවා සැපයීමටත් සිදුවිණ. මෙම තත්ත්වය අඩු වැඩි වශයෙන් වාර්ෂික සිදුවන අතර මෙම තත්ත්වයට වැඩිවශයෙන් ගොදුරුවන්නේ නාගරික දිළිඳු ප්‍රජාවයි.

මෙම තත්ත්වය අවම කිරීමත්, සැලැස්මක් සහිත නාගරික සංවර්ධනයක් කරා නිසි රාජ්‍ය මැදිහත්කමක් සිදුකිරීමත් යන දෙආකාරයම අතිශයින්ම වැදගත් වේ.

මෙහිදී ආපදා අවදානම් සහිත කලාපයන් නිසි පරිදි සිතියම් ගතකොට ඒ සම්බන්ධයෙන් අදාළ දැනුවත් කිරීම් සිදු කෙරුණද එම ස්ථාන හැරයාම කෙරේ ඇති මැලිකම හේතුවෙන් හෝ උචිත විකල්පයක් හඳුන්වා නොදීම නිසා ආපදාවට ලක්වන පිරිස වැඩි වීමත්,






**2010 වසරේ මැදභාගයේ ඇතිවූ හදිසි ගංවතුර තත්ත්වයේ දී අවතැන් වීම් ව්‍යාප්තිය.**

| දිස්ත්‍රික්කය | අවතැන් වූ පවුල් සංඛ්‍යාව | සමස්ත සංඛ්‍යාව |
|---|---|---|
| කළුතර | 29,342 | 120,269 |
| ගම්පහ | 47713 | 192,795 |
| කොළඹ | 3500 | 150,000 |

අක්‍රමවත් සංවර්ධනයෙන් ආපදා අවදානම් සිතියම දිනෙන් දින පුළුල් වී යාම ඊට හේතුව නිසා ගොදුරුවන පිරිස වැඩිවීම සම්බන්ධයෙන් වඩාත් සැලකිලිමත් විය යුතුය.

කොළඹ නගරය ආශ්‍රිතව ඇතිවන ප්‍රධානතම ආපදා තත්ත්වය වන්නේ දැඩි වර්ෂා තත්ත්වයන්වලදී ඇතිවන දැඩි ගංවතුර තත්ත්වයයි. මෙයට ප්‍රධාන හේතුව වන්නේ කොළඹ නගර මුහුදු මට්ටම ආසන්නයේ පැවතීමත් ශ්‍රී ලංකාවේ ප්‍රධානම ගංගාවක් වන කැළණි ගඟ මුහුදට වැටෙන ස්ථානය නගරය ආසන්නයේ





වීමත්, පහතරට තෙත් කලාපයට ඇදහැලෙන වර්ෂාව අධිකවීමත්, සෘජුවම ඇදහැලෙන වර්ෂා ජලය නගරය තුළ ඒකරාශී වීමත් මෙහිදී අධික වැසි තත්ත්වයකදී කැළණි ගඟ ජල මට්ටම ඉහළ යාමතුළත් පහත් බිම්, මුහුදු මට්ටමට සමාන උසකින් පිහිටීමත් හේතුවෙන් ජලය බැසයාම ඉතාම සෙමින් සිදුවීමයි.

2006 වසරේ ඔක්තෝම්බර් මාසයේ ඇතිවූ දරුණු ජලගැලීම් හේතුවෙන් 65000ක් පමණ අවතැන් වූ අතර 8000කගේ පමණ නිවාසවලට අලාභහානි සිදුවිය. මෙම තත්ත්වය වඩා තීව්‍ර වීමට හෙතුව වූයේ ජලය බැසයාමේ ඇළමාර්ග විවිධ හේතුන් නිසා අවහිරව පැවතීමයි. මෙම ආපදා තත්ත්වයේදීත් වඩාත් දුෂ්කරතාවයන්ට ගොදුරු වූ ජන කොටස වූයේ නාගරික දිළිඳු ජන කොට්ඨාසයයි. ජලය බැසයන අතු ගංගාවල ඉවුරු, දුම්රිය මාර්ග ආරක්‍ෂක කලාපය, වෙරළේ ආරක්‍ෂිත ප්‍රදේශය වැනි ඉහළ අවදානමක් ඇති ප්‍රදේශවල ඔවුන්ගේ වාසස්ථාන ඉදිවී තිබීම මීට හේතුවයි.

කොළඹ නගරය සම්බන්ධයෙන් ඇතිවූ තත්ත්වයන් විමසීමේදී කොළඹ නගර සභාවේ ප්‍රධාන පරිපාලන නිළධාරීතුමන් මාධ්‍යයට ප්‍රකාශ කර තිබුණේ කොළඹ නගරයේ ස්ථාපිත කොට ඇති කාණු පද්ධතිය 1938 දී සැලසුම් කළ එකක් බවත් එවකට කොළඹ නගරයේ ජනගහනය 80,000 ක් පමණ වූ නමුත් වර්තමානයේ එම අගය 1300, 000ක් තරම් ඉහළ අගයක් නිසා ඉහළ ගංවතුර අවදානමක් නිර්මාණය වී ඇති බවත්, ඒවායේ නිසි ප්‍රතිසංස්කරණයක් කිරීම දැඩි අවශ්‍යතාවයක් බවත්ය.

දිළිඳුභාවයෙන් ඔබ්බට ගොස් නාගරික දිළින්දකුව ජීවත්වීම තුළින් ස්වාභාවික ආපදාවන්ට ලක්වීමේ අවදානම ඉහළ ගියද නගරයක් ආශ්‍රිතව ජීවත්වීමෙන් ජීවිතය ජයගැනීම සඳහා පුළුල් අවස්ථා රැසක් තමා අවට ඇතැයි සිතමින් ගැන සිහින ලෝකයක සිටීම තුළ නාගරික දිළිඳු ප්‍රජාව දැවැන්ත අර්බුදයකට මුහුණ දී සිටී.

විශේෂයෙන්ම නාගරික දිළින්දන්ගේ වාසස්ථාන ඇත්තේ නිවසක් හෝ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට නුසුදුසු නිසා අත්හැර දමන ලද භූමියක්, ගංගා හෝ ඇළමාර්ගවල ආරක්‍ෂිත ප්‍රදේශයක්, දැඩිලෙස ශබ්ද දූෂණයට ලක්වන දුම්රිය මාර්ග ආසන්නයේ ඇතිබිම් තීරු, නොඑසේනම් නාගරික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා වෙන්කරන ලද භූමිවල මායිම් වැනි නගරයේ වඩාත් කටුක භූමිභාගයන් තුළය.

මෙවැනි භූමියක ජීවත්වීම තුළ ආපදාවන්ට ලක්වීමේ නැඹුරුතාවය ඉතා ඉහළ අගයක් ගන්නා අතර එසේ ජීවත්වීම ඔවුන් නිරන්තරයෙන් ආපදාවන්ට ගොදුරුවීම වළක්වාගත නොහැකි තත්ත්වයකි. එමෙන්ම ඉතා කුඩා භූමිභාගයක විශාල පිරිසක් ජීවත්වීම තුළ නාගරික ජනගහන ඝනත්වය ඉහළ යාමත් ඒ තුළින් ඇතිවන්නා වූ අනෙකුත් සෞඛ්‍ය ගැටලු සහ සමාජ අර්බුද සැලකීමේ දී නාගරික දිළිඳු ජනතාව වෙනුවෙන් ක්‍රමවත් ජීවන සැලැස්මක් ඇතිකරලීම සමස්ත ජනතාව වෙනුවෙන්ම සිදුකෙරෙන යහපත් ක්‍රියාවක් වනු ඇත.

වර්තමාන රජයේ ඉලක්කගත සැලසුමට අනුව කොළඹ නගරය ආසියාවේ ප්‍රධාන පෙළේ වාණිජ නගරයක් ලෙස සංවර්ධනය කිරීමේ ක්‍රියාදාමයේ මූලික අදියරක් ලෙස නාගරික අනවසර පදිංචිකරුවන් එම ස්ථානවලින් ඉවත්කොට වෙනත් ප්‍රදේශයක පදිංචි කරවීමේ සැලසුම් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. මේ සමඟ විවාදයට තුඩුදෙන කරුණු රැසක් මතුවන නමුත්, වැඩිපිරිසකගේ යහපතත්, තිරසර පැවැත්මත් සැලකීමේ දී වඩා මැදහත් විසඳුමක් කරා යාම දැඩි අවශ්‍යතාවයක්ව පවතී. මෙහිදී වඩාත් දුෂ්කරතාවයට මුහුණදෙන පිරිස් උදෙසා ක්‍රමවත් සහන, ප්‍රතිසංස්කරණ වැඩසටහන් මෙන්ම දිගුකාලීනව දිවෙන තිරසර ජීවනෝපාය සංවර්ධන වැඩසටහනක් දියත් කිරීම අනිවාර්යෙන්ම සිදු කළ යුතු වන්නේය. එසේ නොවන්නේනම් මෙමගින් ඔවුන් දැවැන්ත අර්බුදයකට ඇදවැටීම වළක්වාගත නොහැකිය.

මිනිස් වාසස්ථාන සම්බන්ධයෙන් කටයුතු කරන එක්සත් ජාතීන්ගේ වැඩසටහන (UN-HABITAT) මගින් දිරිගන්වනු ලබන සමාජයීය සහ පාරිසරික වශයෙන් තිරසාර නගර සංකල්පය තුළින් සහශ්‍ර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අරමුණින් පහත

සඳහන් කාරණා කෙරේ විශේෂ අවධානය යොමු කොට ඇත.

- 'සැමට නිවහනක් 'සංකල්පය දිරිගැන්වීම.
- නාගරික පාලනය වැඩිදියුණු කිරීම.
- නාගරික දරිද්‍රතාවය අවම කිරීම.
- යහපත් පරිසරයක් ඇති කිරීම.
- ආපදා අවදානම් සහ පශ්චාත් ගැටුම් ප්‍රතිසංස්කරණ සැලැස්ම.

එක්සත් ජාතීන්ගේ වාසස්ථාන පිළිබඳ වැඩසටහන (UN - HABITAT) මඟින් සාමාජික රාජ්‍යයන්ගේ නාගරික සංවර්ධනයේදී උපක්‍රමශීලී ක්‍රමවේදයක් තුළින් ක්‍රමානුකූලව මුඩුක්කුවලින් තොරවූ නගර ඇති කිරීම දිරිමත් කරමින් පවතී.

මෙම ඉලක්කය යටතේ එක්සත් ජාතීන්ගේ මිනිස් වාසස්ථාන පිළිබඳ වැඩසටහන ශ්‍රී ලංකා රජය සමඟ එක්ව ක්‍රියාකරමින් පහත සඳහන් ක්ෂේත්‍ර සංවර්ධනය සඳහා ප්‍රමුඛතාවයන් ලෙස හඳුනාගෙන ඇත.

තිරසාර මූල්‍ය යන්ත්‍රණයක් තුළින් ඉතා ඉහළ ගුණාත්මක බවින් යුත් නිවාස ඉදිකර නාගරික අඩු පහසුකම් සහිතව මුඩුක්කු ආශ්‍රිතව ජීවත්වන මිනිසුන් ඒවායේ පදිංචි කරවීම.

නිවාස, පිරිසිදු පානීය ජලය, සනීපාරක්ෂක පහසුකම්, විධිමත් කාණු පද්ධති, කසල කළමනාකරණය සහ ආරක්ෂිතව ජීවත්වීමේ පරිසරය ඇතුළු මූලික පහසුකම් ඉහළ නැංවීම.

නිවාස සංවර්ධන අමාත්‍යංශය හා එක්ව ජාතික නිවාස ප්‍රතිපත්තියක් ඇති කිරීම.

පදිංචි ඉඩම්වල භුක්තිය තහවුරු කිරීම.

ඉහත ප්‍රමුඛතා ක්ෂේත්‍ර සංවර්ධනය සඳහා එක්සත් ජාතීන්ගේ මිනිස් වාසස්ථාන පිළිබඳ වූ වැඩසටහන් දැනටමත් ශ්‍රී ලංකාවේ ප්‍රදේශ ගණනාවක විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය අනුග්‍රහය ලබාදෙමින් පවතී.

දශක ගණනාවක් තිස්සේ දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දෙමින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගරයන්ගේ වඩාත්ම දුෂ්කර වූ භූමි ප්‍රදේශ තම වාසභූමි කරගනිමින් ජීවත්වන ජන කොට්ඨාසය ජාතික සංවර්ධනය උදෙසා නිසි පරිදි හවුල් කරවා ගැනීමත්, වඩාත් සැලසුම් සහගත සහ ආකර්ෂණීය නාගරික පරිසරයක් ඇති කිරීමත් උදෙසා රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික ආයතන, ප්‍රජා සංවිධාන සහ ප්‍රජා නායකයින් එක්වී සම සාධරණ වූ පිළියමක් යෙදවීම වර්තමානයේ අත්‍යවශ්‍ය කරුණක්ව පවතී. ආපදාවක් (Disaster) සිදුවීමට නම් යම් උවදුරක් (Hazard) සහ අනතුරට භාජනය විය හැකි ප්‍රජාවක් (Vulnerasce Community) යන අංග දෙකම එකවිය යුතුය. ආපදාව අවම කිරීම සඳහා අනතුරට ලක්විය හැකිබව (Vulnerablity) අවම කිරීම වඩාත් සාර්ථක පිළියමයි. මේ තත්ත්වයන් හේතුවෙන් ඇතිවන්නාවූ ආපදා තත්ත්වයන්ගේ ආසන්නතම ගොදුර බවට පත්වන නාගරික පැල්පත් වාසී ජනතාව පත්ව සිටින්නා වූ තීරණාත්මක තත්වය පටු දේශපාලන අවස්ථාවාදයක් බවට පත් නොකොට ඔවුන්ගේ ඉදිරි පරම්පරාවන්වත් මේ උගුලෙන් ගලවාගැනීම සඳහා ක්‍රියා කිරීම සමස්ත ලාංකීය ජනතාවගේම වගකීමක් වනු ඇත.

